ආලයඩිවේම්බු ප්‍රාදේශීය සභාව - 2024
---

1 මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ආලයඩිවේම්බු ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ආලයඩිවේම්බු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව ප්‍රකාරව, රු.15,150කට වෙන්දේසියේ විකුණූ මූලධන භාණ්ඩවල පිරිවැය සහ කපාහැර දැමූ පොත් 141ක වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලින් අඩුකර දක්වා නොතිබුණි.	ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවලින් අඩුකර දැක්වීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වෙනුවෙන් ගෙවිය යුතු ඉන්ධන වියදම් රු.144,430ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ඉදිරියේදී එම වියදම් ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරන බව.	-එම-
(ඇ)	සමාලෝචිත වර්ෂයේ රු.259,000 කට මිලදී ගෙන තිබුණු ඡායා පිටපත් යන්ත්‍රයේ බිල්පත 2024 අගෝස්තු 08 දින ලැබී තිබූ නමුත්, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල බැරකමක් ලෙස දක්වා නොතිබුණි.	ඉදිරි කාලයේ එම වියදම් ගෙවිය යුතු ඒවා ලෙස දැක්වීමට පියවර ගනු ලබන බව.	-එම-
(ඈ)	LDSP වැඩසටහන යටතේ ඉදිකළ බහුකාර්යය ගොඩනැගිලිල්ලේ අවසන් බිල්පත් ගෙවීම් රු.1,608,838ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ඉදිරියේදී මෙය බැරකමක් ලෙස දැක්වීමට කටයුතු කරන බව.	-එම-

(ඉ)	සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩගාස්තු හා ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාල මුද්දර ගාස්තු ආදායම් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	අයකර ගැනීම් නොපමාව ලබාගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලබන බව.	ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 128 වගන්තිය	සභාව විසින් පරිහරණය කරනු ලබන දේපළ හඳුනාගෙන පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි.	පිළිතුරු ලබාදී නොමැත.	පනතේ විධිවිධාන ප්‍රකාරව, පියවර ගතයුතුය.
(ආ)	1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පාලන) රීති මාලාව			
	(i) 5(xii) රීතිය	මුදල් හා චෙක්පත්වල අත්සන් කරනු ලබන නිලධාරීන්, ආදායම් රැස්කිරිමේ නිලධාරී සහ ගබඩා ද්‍රව්‍ය ආදිය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප මුදලක් ලබාගැනිමට පියවර ගෙන නොතිබුණි.	පිළිතුරු ලබාදි නොමැත.	මූල්‍ය හා පාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
	(ii) **59** රීතිය	සභාවේ ආදායම් පරීක්ෂක විසින් සෑම වර්ෂයක් ආරම්භයේදීම ව්‍යාපාර පිළිබඳ සමීක්ෂන වාර්තාවක් සකස් කර මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයාට ඉදිරිපත් කිරිමට පියවර ගෙන නොතිබුණි.	පිළිතුරු ලබාදි නොමැත.	-එම-
	(iii) **81** රීතිය	සෑම කාර්තුවක් අවසානයේදීම ඉඩම් ගනුදෙනු පිළිබඳ මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා	පිළිතුරු ලබාදි නොමැත.	මූල්‍ය හා පාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

වෙත යැවීමට පියවර ගෙන නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,274,731 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,477,087 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන් තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේ න්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	4,500,000	1,546,992	1,440,688	106,303	2,500,000	1,151,488	1,104,579	46,909
(ii)	කුලී	4,850,000	3,592,034	3,031,511	560,513	5,950,000	6,181.187	5,542,903	666,783
(iii)	බලපත්‍ර ගාස්තු	1,195,000	1,116,705	1,100,025	16,680	1,195,000	692,090	675,410	16,680
(iv)		3,820,000	2,197,998	2,197,998	-	11,910,000	11,550,940	11,550,940	-
	වෙනත් ආදායම්						-		
	එකතුව	14,365,000	8,453,729	7,770,222	683,496	21,555,000	19,575,705	18,873,832	730,372

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණයන් පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් 1988 සිට 2022 දක්වා කාල පරිච්ඡේදය තුළ අයකළ යුතු හිඟහිටි මස්කඩ කඩකුලී රු.560,513ක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනැවිත් තිබූ අතර එම ශේෂය අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඔබ විසින් සඳහන් කළ වටිනාකම පොත්වලින් කපාහැරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	දීර්ඝ කාලයක සිට හිඟ හිටි මස්කඩ කුලී අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කළ යුතුය.

(ආ)	කසල බදු වෙනුවෙන් රු.7,500,000ක් ඇස්තමේන්තු කර රු.2,184,985ක් අයකර තිබුණි. මෙම ඇස්තමේන්තුගත වටිනාකම සත්‍ය වශයෙන්ම අයවිය යුතු පදිංචිකරුවන්ගේ හා කඩහිමියන්ගේ ලැයිස්තුව පදනම් කරමින් ගණනය කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ සිට විධිමත් ඝන අපද්‍රව්‍ය ලේඛන සකස් කර නිවාස හිමියන්, කඩහිමියන් සහ හෝටල්වලින් අයකර ගැනීමට පියවර ගනු ලබන බව.	නිසි පරිදි ලේඛන පවත්වා විධිමත් ලෙස අයකිරීම් සිදුකළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාරික ස්ථාන 18කින් දැන්වීම් පුවරු සඳහා රු.135,625ක් අයකර තිබූ නමුත්, සභාවේ ආදායම් ඉහළ නංවා ගැනිම සඳහා ඉතිරි ව්‍යාපාරික ස්ථානවල පවතින දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය කිරීමට අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර හෝ විධිමත් අවසර ලබාගෙන ගෙන නොතිබුණි.	වෙළෙඳ බලපත්‍ර ගාස්තු ලේඛනයේ සඳහන් ව්‍යාපාරික ස්ථානවල සවිකර ඇති දැන්වීම් පුවරුවල අයකිරීම් සිදුකිරීමට පියවර ගනු ලබන බව.	විධිමත් අවසර ලබාගෙන අයකිරීම් සිදුකිරීමට පියවර ගතයුතුය.
(ඇ)	සභාව විසින් 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ මුද්දර ගාස්තු සහ 2024 නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාල උසාවි දඩ ගාස්තු නියමිත කාල වකවානුවල ගණනය කිරීම් කර ඉල්ලීම් ඉදිරිපත් කර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරි කාලවල මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් අයකිරීම් නොපමාව ලබා ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලබන බව.	පනතේ ප්‍රකාරව ඉල්ලුම් කර ලබා ආදායම් රැස්කර ගැනීමට පියවර ගතයුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 ආර්ථික නොවූ ගනුදෙනු

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සභා බලප්‍රදේශයේ රැස්කරනු ලබන දිරන කසල ටොන් 01ක් සඳහා රු.200ක් හා නොදිරන කසල ටොන් 01 ක් සඳහා රු.300ක් ගෙවා තිබුණි. සභාව ජනතාවගෙන් දෛනික වර්ග කර ලබාගන්නා ඝන අපද්‍රව්‍ය කාබනික පොහොර නිෂ්පාදනය සඳහා භාවිතා කළේ නම් බැහැර කරන කසල සඳහා ගෙවා තිබුණු මුදල් ඉතිරි කර ගතහැකිව තිබුණි. මෙවැනි මෙහෙයුම් ඉටුකිරිමට අපොහොසත් වීමෙන් සමාලෝචිත වර්ෂයේ කසල බැහැර කිරීමේ ගාස්තු ලෙස රු.418,826ක් හා කසල ප්‍රවාහනය කිරීම සඳහා තවත් පිරිවැයක් ද දරා තිබුණි.	වර්තමානයේ අප සභාව විසින් රැස්කරන අපද්‍රව්‍ය වර්ග කර ලබාගැනීමේ ක්‍රියාමාර්ග සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර ඇති බව.	කසල වර්ග කර ලබා ගැනීමට පියවර ගතයුතු අතර එම කසල කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යෙදවීමට හමහෙයුම් ක්‍රියාත්මක කල යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 ජූලි දක්වා රු.492,634ක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට සභාව විසින් ගෙවිය යුතු ලෙස ලිපි මගින් දැනුම් දීම් සිදුකර තිබූ නමුත් ඒ පිළිබඳ කිසිඳු තොරතුරක් සභාවේ දක්නට නොවීය. එසේ වුවත්, එහි සත්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමට සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට නිවැරදි වටිනාකම පිළිබඳ විස්තර විමසා ලිපි යවා ඇති බව.	ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් විමසා නිරවුල් කරගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

3.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වටිනාකම රු.3,297,000ක් වූ තෙල් ඇඹරුම් යන්ත්‍රෝපකරණ පෙර වර්ෂයේ මිලදී ගෙන තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් උපයෝජනය කර නොතිබුණි.	යන්ත්‍රෝපකරණ ආලෙයියඩිවේම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා කාන්තා සංවිධානයක් සමග ගිවිසුම්ගතව ඒවා මේ වන විට ක්‍රියාත්මකව පවතින බව.	එම යන්ත්‍රෝපකරණ උපයෝජනය කිරීමට පියවර ගතයුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු සහ සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම්, ගොඩනැගිලි සහ වාහන 30ක පිරිවැය සහ එහි ප්‍රත්‍යාගණිත වටිනාකම් ගණනය කර ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කර නොතිබුණි.	ඉදිරි කාලයේ ප්‍රත්‍යාගණනය කර යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලබන බව.	ප්‍රත්‍යාගණනය කර ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීමට පියවර ගත යුතුය.
(ආ)	සභාවට අයත් වාහන 04 ක් අලුත්වැඩියා කර නැවත පරිහරණය කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට සභාව පියවර ගෙන නොතිබුණි.	හානියට පත් වාහන වෙන්දේසියේ විකිණීම සම්බන්ධයෙන් තොරතුරු පළාත් පාලන දෙපාර්තමේන්තුවට යොමු කර ඒ අනුව පියවර ගනු ලබන බව.	වාහන අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට පියවර ගත යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් සමාලෝචිත වර්ෂයේ විද්‍යුත් පුස්තකාලය (E-Library) සහ කාර්යාල භාවිතය සඳහා රු. 947,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු පරිගණක, මුද්‍රණ යන්ත්‍ර සහ අනෙකුත් උපකරණ නියමිත තත්ත්වයෙන් අපේක්ෂිත ගුණාත්මක බවින් යුක්තද යන්න ඒ පිළිබඳ විශේෂඥ දැනුම සහිත පාර්ශවයන් විසින් තහවුරු කර නොතිබුණි.	ඉදිරියේදී භාණ්ඩ ලැබුණු පසුත් කමිටු වාර්තාව ලැබීමෙන් පසුව පමණක් ගෙවීම් සිදුකරන බව.	අදාල උපකරණ වල තත්ත්වය විශේෂඥ දැනුම සහිත පාර්ශවයන් විසින් තහවුරු කළ යුතුය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් LDSP වැඩසටහන යටතේ රු.8,181,057ක් ඇස්තමේන්තු කර රු.9,523,092 ක් වැයකර වැඩ අවසන් කළ කාර්යාල පරිශ්‍රයේ පිහිටි ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේදී රු.962,257ක් වටිනා වැඩක්ද සම්පූර්ණ කර නොතිබුණි. පසුගිය වර්ෂයේ LDSP අරමුදල් මඟින් මිලදී ගෙන තිබුණු යන්ත්‍රෝපකරණ සවිකර පොල්තෙල් නිෂ්පාදන ඒකකය ස්ථාපිත කර තිබූ නමුත් අමුද්‍රව්‍ය නොමැති වීමෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි.	ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණයේදී G4 සඳහා වූ අවශ්‍යතාවය පැන නැගුණු බැවින් එම කාර්යය ඉටුකරන ලද බව සහ වර්තමානයේ මෙම ව්‍යාපෘතිය මහජන ප්‍රගතිශීලී සංවර්ධන සංගමයේ තරුණ සංවිධානය සමග ගිවිසුම්ගතවී ඇති අතර පෙරහුරුවකින් පසු ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට පියවර ගෙන තිබෙන බව.	පොල්තෙල් නිෂ්පාදනය ක්‍රියාත්මක කිරීමට පියවර ගතයුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සේවකයින් 04කගෙන් දීර්ඝ කාලයක සිට අය නොවී පවතින හිඟහිටි ආපදා ණය රු.65,069ක් අයකර ගැනීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.	ඉදිරියේදී මෙම නිලධාරීන්ට හිමි පාරිතෝෂික ලැබූ විට ණය ශේෂය අයකර නිරවුල් කිරීමට කටයුතු කරන බව.	හිඟහිටි අයකරගැනීමට කටයුතු කළ යුතුය.

3.8 වාහන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 07 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	වාහනවල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව.	වාහනවල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාව සතු වාහන 04ක් හානියට පත්වී තිබූ නමුත් ඒවා අළුත්වැඩියා කර නැවත භාවිතා කිරිමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.	අළුත්වැඩියා කළ හැකි වාහන අළුත්වැඩියා කිරීමට හා ඉතිරි ඒවා වෙන්දේසියේ විකිණීමට පියවර ගනු ලබන බව.	නැවත භාවිතා කිරිමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට සභාව විසින් පියවර ගත යුතුය.

4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ 2022 ජනවාරි 11 දින පැවැති 46වැනි සභා රැස්වීමේදි අංක 46/05 දරන තීරණ ප්‍රකාරව, අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීමට නිලධාරීන් තිදෙනෙකු පත්කර තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 30 වගන්තිය හා මුදල් රෙගුලාසි 133(1) ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මගින් ආයතන මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය සහ කාර්යාසාධනය ඉහළ නැංවීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරිමට ජොෂ්ඨ නිලධාරීන් තිදෙනෙකු පත්කර ආයතන මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය සහ ඔබ සමග එක්ව උපදෙස් ලබාගැනීමටත් පියවර ගනු ලබන බව.	අභ්‍යන්තර විගණනයේ ඵලදායීතාවය වැඩි කිරීමට පියවර ගතයුතුය.

4.2 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමටත්, මැනීම සඳහා දර්ශක ස්ථාපිත කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ අයවැයෙහි තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලසීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.	සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගෙන ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන අයවැයෙන් සලසා ගෙන ඇති බව.	තිරසාර සංවර්ධන පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

4.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් නිශ්චිත ප්‍රදාන සංවර්ධන වැඩසටහන යටතේ 2016 වර්ෂයේ රු.1,253,940 ක වියදමින් කන්නගිපුරම්හි කාබනික පොහොර සැකසීමේ මධ්‍යස්ථානය ඉදිකර කාබනික පොහොර සැකසීම සඳහා 2018 වර්ෂයේ රු.1,210,000කට යන්ත්‍රෝපකරණ මිලදීගෙන තිබුණි. එසේ වුවත්, විගණිත දින වන විටත් අදාළ යන්ත්‍ර කිසිදු භාවිතයකින් තොරව පැවැති අතර, එම මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමට වර්ෂ 07කට අධික කාලයක සිට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර මෙම නිශ්චිත අරමුණ සඳහා සලසා තිබූ මූල්‍ය ප්‍රතිපාදන නිෂ්කාර්ය වී පැවැතුණි.	මෙම වර්ෂයේ කන්නගිපුරම්හි ජනතාව සමග අවසන් අදියරේ දැනුවත් කිරීමේ රැස්වීම් පැවැත්වීම සඳහා විධිවිධාන සලසා ඇත. ඉන් පසුවත් ජනතාව අඛණ්ඩව විරෝධතාව දැක්වුවහොත් කාබනික පොහොර සැකසීමේ යන්ත්‍රය සභාවේ අනුමැතිය සහිතව සුදුසු ප්‍රාදේශීය/නගර/ මහනගර/ සභාවකට ලබාදීමට පියවර ගනු ලබන බව.	කිසියම් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය.